# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1819/7 – 2013 ජූලි 16 වැනි අඟහරුවාදා – 2013.07.16

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡේදය – සාමාන්‍ය

## ආණ්ඩුවේ නිවේදන

මගේ අංකය: සී.අයි.1814.

**කාර්මික ආරාවුල් පනත - 131 වන අධිකාරය**

එක් පාර්ශ්වයක් වශයෙන් අතුරුගිරියේ ඔරුවල පිහිටි සිලෝන් ස්ටීල් කෝපරේෂන් ලිමිටඩ් සහ අනෙක් පාර්ශ්වය වශයෙන් බත්තරමුල්ල, සුභූතිපුර වීර මාවතේ. අංක 12/2 දරන ස්ථානයෙහි පිහිටි අන්තර් සමාගම් සේවක සංගමය අතර 2012 අප්‍රේල් මස 11 වැනි දින ඇති කර ගන්නා ලද සාමූහික ගිවිසුම් පත්‍රය ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය වන (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) කාර්මික ආරාවුල් පනතේ 06 වන වගන්තිය අනුව මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

**වී. බී. පී. කේ. වීරසිංහ,**
**කම්කරු කොමසාරිස්.**

2013 ජූලි මස 01 වැනි දින,
කොළඹ 05,
කම්කරු දෙපාර්තමේන්තුව.

2013 අංක 12 දරන සාමූහික ගිවිසුම

**සාමූහික ගිවිසුම**

මෙම සාමූහික ගිවිසුම සේවා යෝජක පක්ෂය වන අතුරුගිරියේ ඔරුවල පිහිටි සිලෝන් ස්ටීල් කෝපරේෂන් ලිමිටඩ් ආයතනය හා සේවක පාර්ශ්වය වන අංක 12/2, වීර මාවත, ශ්‍රී සුභූතිපුර, බත්තරමුල්ල ලිපිනයේ සඳහන් අන්තර් සමාගම් සේවක සංගමය සමග අද දින ඇති කර ගන්නා ලද අතර පහත සඳහන් එකඟතාවයන් 2013 අප්‍රේල් මස 02 වැනි දින සිට 2016 අප්‍රේල් මස 01 වැනි දින දක්වා වසර 03 ක කාලයක් සඳහා බලාත්මක වන ලෙස දෙපාර්ශ්වය විසින් ගිවිස ගන්නා ලදී.

1. **වැටුප් වැඩිවීම.** – පළමු වර්ෂය තුළ රු. 1750.00ක දීමනාවක් හා මූලික වැටුපට රු. 500.00 ක්ද,

දෙවන වර්ෂයට රු. 750.00 ක දීමනාවක් හා මූලික වැටුපට රු. 500.00ක් ද,

තෙවන වර්ෂයට රු. 1000.00 ක දීමනාවක් හා මූලික වැටුපට රු. 500.00 ක් ද ලෙසින් වසර 03 කට බල පැවැත්වෙන පරිදි සිලෝන් ස්ටීල් කෝපරේෂන් ලිමිටඩ් ආයතනයේ සියලුම ස්ථිර සේවකයින්ට ලබා දීමට එකඟ වන ලදී. ප්‍රවාහන හා ආහාරවල මිල ගණන්ද සැලකිල්ලට භාජනය කර මෙම වැටුප් වැඩිවීම ලබා දීමට තීරණය කරන ලදී.

1A – G17967 325 (2013/07)

සැ.යු.– මෙම ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැකිය.

2. **සේවක උසස් වීම්.**– දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අනුමැතිය මත සේවකයාගේ කුසලතාවය ඇගයීමට ලක් කොට උසස්වීම් ලබා දීමට එකඟ වන ලදී.

3. **කොන්ත්‍රාත් සේවකයින් ස්ථිර කිරීම.** – සේවකයින් සේවය කරන දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සේවා ඇගයීම, ආයතනයට ඇති අවශ්‍යතාවය, සේවකයාගේ කුසලතාවය. පැමිණීම හා විනය යන කරුණු පදනම් කරගෙන සකසනු ලබන ක්‍රමවේදයකට අනුව මෙම ගිවිසුම අත්සන් කිරීමෙන් පසු මාස 03 ක් ඇතුලත වාර්ෂිකව කොන්ත්‍රාත් සේවකයින් 10 දෙනෙකු බැගින් ස්ථිර කිරීමට එකඟ වන ලදී.

4. **නිල ඇඳුම.** – වසරකට එක් සේවකයෙකුට දැනට දෙනු ලබන ටී ෂර්ට් 03 ක් ලබා දීමට එකඟ වන ලදී. සේවකයින් විසින් ආරක්ෂක උපකරණ පැළඳීම කළ යුතු වේ.

5. **විනෝද චාරිකාව.**– වාර්ෂිකව ආයතනය විසින් සේවකයින්ට විනෝද චාරිකාවක් ලබා දීමට එකඟ වන ලදී.

6. **විපත් ණය මුදල්.** – දැනට පවතින ක්‍රමවේදය අනුව ලබා ගත් ණය මුදලේ 2/3 ගෙවී අවසන් වූ පසු වැටුපෙන් 40 % සීමාව සලකා බලා අවශ්‍ය සේවකයින් සඳහා මෙම දීමනාව ලබා දීමට එකඟ වන ලදී.

7. **වෘත්තීය සමිති ක්‍රියා මාර්ග.**– මෙම ගිවිසුම බලාත්මකව පවතින කාල සීමාව තුළ දී මෙම ගිවිසුමට අදාලව හෝ ඉන් පැන නගින කුමන හෝ වෘත්තීය සමිති ක්‍රියාමාර්ගයකට අවතීර්ණ නොවීමට වෘත්තීය සමිතිය හා සේවකයින් එක්ව සහ වෙන් වෙන්ව එකඟ වෙයි.

8. මෙම සාමූහික ගිවිසුම වලංගුව පවත්නා කාලය තුළදී කිසියම් පාර්ශ්වයක් විසින් අන්‍යෝන්‍ය එකඟතාවයකින් හැර, සාමූහික ගිවිසුමේ කිසියම් කොන්දේසියක් හෝ කොන්දේසි මොනයම් අන්දමක හෝ වෙනස් කිරීමට හෝ සංශෝධනය කිරීම සිදු කළ නොහැක.

9. සේව්‍ය/සේවකයින් සහ වෘත්තීය සමිතිය එකිනෙකා සමග සහයෝගය දක්වමින් දූෂණය, නාස්තිය වළකාලමින් සමාගමේ නිරන්තර දියුණුවට සහ ආයතනයේ ඵලදායිතාවය වැඩි කිරීමට කැප වීමෙන් කණ්ඩායම් හැඟීමෙන් වැඩ කරන බවට එකඟ වේ.

10. වෘත්තීය සමිතිය සහ සේවකයින් තමන්ට නියම කර ඇති සේවා කටයුතු හොඳින් සිදු කිරීමට එකඟ වන අතර නිෂ්පාදන අංශයේ සේවකයින් නියමිත නිෂ්පාදන ඉලක්කයන් ලබා දීමට එකඟ වෙයි.

11. සමාගමේ සියලු උපකරණ සහ වත්කම් ආරක්ෂා කිරීමට මෙන්ම ආයතනයේ නිෂ්පාදන ක්‍රියාවලියේ හා වෙළඳ කටයුතු සම්බන්ධව කිසිදු කරුණක් හෙළිදරව් නොකිරීමට හා එහි රහස්‍යභාවය සුරැකීමට වෘත්තීය සමිතිය සහ සේවකයින් එක්ව හා වෙන් වෙන්ව එකඟ වේ.

ඉහත අනුව කටයුතු කිරීමට එකඟ වෙමින් දෙපාර්ශ්වය විසින් මෙයට සාක්ෂි ලෙස 2013.04.11 වැනි දින කොළඹ දී අත්සන් තබන ලදී.

.......................................
සිංකෝන් ස්ටීල් කෝපරේෂන් ලිමිටඩ්
ආයතනය වෙනුවෙන්
මානව සම්පත් කළමනාකාර

.......................................
සිංකෝන් ස්ටීල් කෝපරේෂන් ලිමිටඩ්
ආයතනය වෙනුවෙන්
පරිපාලන සහකාර

.......................................
අන්සර් සමාගම් සේවක සංගමය
එහි සභාපති

අංක 12/2,

.......................................
අන්සර් සමාගම් සේවක සංගමය
එහි ලේකම් -

.......................................
සිංකෝන් ස්ටීල් කෝපරේෂන් ලිමිටඩ්
ශාඛාවේ සභාපති

.......................................
සිංකෝන් ස්ටීල් කෝපරේෂන් ලිමිටඩ්
ශාඛාවේ ලේකම් -



ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.